# ෂට් ශාස්තෘවරු

බ්‍රාහ්මණ ධර්මය සමාජයේ මහත් බලයක් ඇතිව වැජඹෙද්දී තවත් ශාස්තෘවරු පිරිසක් භාරතීය සමාජයෙහි ඉස්මතුව ආහ. ෂඩ් ශාස්තෘවරු යන නමින් සාමාන්‍යයෙන් හැඳින්වුණු අතර,

1. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ පූරණ කස්සපෝ අකිරියං බ්‍යාකාසි.
2. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ මක්ඛලී ගෝසාලෝ සංසාර සුද්ධිං බ්‍යාකාසි.
3. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ අජිත කේසකම්බලෝ උච්ඡේදං බ්‍යාකාසි.
4. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ පකුධ කච්චායනෝ සත්තකායං බ්‍යාකාසි.
5. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ සංජය බෙල්ලට්ඨිපුත්තෝ වික්ඛේපං බ්‍යාකාසි.
6. සාමඤ්ඤං පුට්ඨෝ සමානෝ නිඝණ්ඨනාථ පුත්තෝ චාතුයාමං බ්‍යාකාසි.

## අජිත කේශකම්බලී

හේ නමින් අජිත විය. කෙස්වලින් කරන ලද කම්බිලියක් හෙවත් සැට්ටයක් නිසා මොහු කේශකම්බිලි නම් විය. අත්තකිලමතානුයෝගයට බර වූ දිවියක් ගෙවූ මොහු නොනෑම, දූලි රැවුල් නොකැපීම ආහාරපාන ගැන කල්පනා නොකිරීම, අපිරිසිඳු වස්ත්‍රාභරණ දැරීම ආදී විවිධ ක්‍රියාකාරකම් තුළින් ඔහු සිය අල්පේච්ඡතාව ප්‍රකට කර ඇත්තේ ය. මෙලෙසින් දුෂ්කර දිවියක් ගෙවූ ශාස්තෘවරයෙකු හැටියට අජිත කේශකම්බලී හැඳින්විය හැකි බව සභිය සූත්‍ර වර්ණනාවෙහි සඳහන්ය.

මොහු දෙසූ දහම මෙබඳුය. දන් දීමෙහි හා සිල්රැකීමෙහි ඵලයක් නැත. පූජා ආදිය ද නිෂ්ඵලය. කුසල ක්‍රියාවල මෙන්ම අකුසල ක්‍රියාවලි ද ප්‍රතිඵල නොමැත. මේ ලෝකය ඇත. එහෙත් පරලෝකය කියා යමක් නැත. මවට පියාට හා ශ්‍රමණ බමුනු ආදීන්ට සැලකීමේ විපාක නැත. ආපෝ, තේජෝ, වායෝ, පඨවි යන සතර මහා භූතයන්ගෙන් තැනුණු මිනිසා මිය ගිය විට එම කොටස් බාහිර ලෝකයේ ඇති ඒවායේ ප්‍රධාන කොටස් සහ එක්වේ. ඔහුගේ ගුණ අගුණ යන සියල්ල සොහොනින් නිමා වේ. නුවණැති, නුවණ නැති, පණ්ඩිත, අඥාන, සිල්වත්, දුසිල්වත්, හොඳ, නරක සහ යහපත්, අයහපත් ආදී විශේෂණ පදවලින් හඳුන්වන සියලු දෙනා පත්වන්නේ එම එකම තත්ත්වයටයි. එය ඔවුන්ගේ නියත අවසානය වන අතර ඔවුන් යළි උපදින්නේ නැත. භගවත් ගීතාවේ දැක්වෙන ආත්මවාදී ඉගැන්වීම් අනුව ආත්මය මැරිය නොහැක. සත්වයා මළත් ආත්මය නොමැරේ. සත්වයා මැරුවත් ආත්මය මැරීමට නොහැක. ආත්මය සදාකාලිකය.

| | | |
|---|---|---|
| 1. | නත්ථිදින්නං | ( දුන් දෙයෙහි විපාක නැත ) |
| 2. | නත්ථි යිට්ඨං | ( යාගයෙහි විපාක නැත ) |
| 3. | නත්ථිහුතං | ( හෝම යාගයෙහි විපාක නැත ) |
| 4. | නත්ථි සුකට දුක්ඛට කම්මානං ඵලං විපාකෝ | ( කුසලාකුසල කර්මයන්ට ඵලවිපාක නැත ) |
| 5. | නත්ථිඅයං ලෝකෝ | ( පරලොව සිටිනවුන්ට මෙලොවක් නැත ) |
| 6. | නත්ථි පරෝ ලෝකෝ | ( මෙලොව සිටිනවුන්ට පරලොවක් නැත ) |
| 7. | නත්ථි මාතා | ( මවට උපකාර කිරීමෙහි විපාක නැත ) |
| 8. | නත්ථි පිතා | ( පියාට උපකාර කිරීමෙහි විපාක නැත ) |
| 9. | නත්ථි සත්තා ඕපපාතිකා | ( ඕපපාතික සත්වයෙක් නැත ) |
| 10. | නත්ථි ලෝකේ සමණ බ්‍රාහ්මණා | ( මහණ බමුණු කෙනෙක් නැත ) |

Hosted by – www.eduLanka.LK

යනුවෙන් දස වස්තුවක් විස්තර කෙරේ. සත්වයාගේ ස්වභාවය පිළිබඳව මෙම ශාස්තෘවරයා දක්වා ඇත්තේ සතරමහා භූතවල එකතුවෙන් ඇති වන බවයි. සතර මහා භූත නොනැසේ. ස්ථිරය. සතරමහා භූත නම්,

| 1. පඨවි | 2. ආපෝ | 3. තේජෝ | 4. වායෝ |
|---|---|---|---|

"....චාතුම්මහා භූතිකෝ අයං පුරිසෝ..." යන්නෙන් එය ඉගැන්වෙයි. සත්වය මළපසු ඔහුගේ පඨවි ධාතු බාහිර ලෝකයේ පඨවි ධාතු හා එකතු වෙයි. "...... චාතුම්මහා භූතිකෝ අයං පුරිසෝ... යදා කාලං කරෝති, පඨවි පඨවිකායං අනුපේති අනුපගච්ඡති"

යන්නෙන් ඉහත සඳහන් අදහස ලබාදෙයි. ඒ අනුවම ආපෝ ධාතු, තේජෝ ධාතු වායෝ ධාතු බාහිර ලෝකයේ එම ධාතූන් හා එක් වෙති. ඉන්ද්‍රියයෝ අහසට යති. මෘත ශරීරය ඇඳ තබා ඥාතීහු එක්ව සුසානභූමිය වෙත ඔසවාගෙන යති. ගුණ ගීතිකා ගයා දරසැයක තබා අළු කරති. ජීවතුන් අතර සිටින තෙක් කරන ලද කුසල් අකුසල්, යහපත් අයහපත් සියලුම ක්‍රියා අලු ගොඩක් බවට පත්වෙයි. මේ අනුව දන්දීම යනු මෝඩ ජනයාගේ ක්‍රියාවකි. සිල් රැකීම, භාවනාව ආදිය නිරර්ථකය. පරලොවක් නැත. එබැවින් ආත්ම දමනයෙන් තපසින්, බ්‍රහ්මචර්යාවෙන් කිසිදු ප්‍රතිඵලයක් නො ලැබේ. බාල පණ්ඩිත කවුරුත් මරණින් පසු එකම අලු ගොඩක් බවට පත්වෙති. සර්ව දර්ශන සංග්‍රහයේ එම දර්ශනය පිළිබඳව තවදුරටත් මෙසේ විස්තර දැක්වෙයි.

**යාවත් ජීවං සුඛං ජීවේත්**
**ඍණං කෘත්වා ඝෘතං පිබේත්**
**භශ්මී භූතස්‍ය දේශස්‍ය**
**පුනරාගමනං කුතඃ**

≥ """"යම්තාක් කල්ජීවත් වෙයිද ඒතාක් කල සැපසේ ජීවත් විය යුතුය. ණය වී හෝ ගිතෙල් අනුභව කළ යුතුය. මරණින් පසු ශරීරය අලුකර දමන බැවින් ඉන්පසු උපතක් නැත.""""≤

- **කුසලානුකුසල කර්මයන්ගේ යහපත අයහපත පින් පව් ප්‍රතික්ෂේප කිරීම අකිරියවාදය යි.**
- **සෑම සත්ත්වයෙකුට ම ආත්මයක් තිබේ. එහෙත් එය මරණයෙන් පසුව හෙවත් මේ භවයෙන් අනතුරුව නිමාවට පත් වෙනවා යැයි කීම උච්ඡේදවාදයයි.**
- **දස හේතුක මිත්‍යා දෘෂ්ටියක් ඉදිරිපත් කරමින් සෑම සියලු දෙයකටම නැත, නැත..... යනුවෙන් ප්‍රකාශ කිරීම නාස්තිවාදය යි.**

arunagunasekare@gmail.com
lankawehondamabcpanthiya@rocketmail.com

**අරුණ ගුණසේකර**
ගෞරව, විශේෂවේදී උපාධිධාරී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ඩිප්ලෝමාධාරී

Hosted by – www.eduLanka.LK